// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,447- 2006 මැයි 26 වැනි සිකුරාදා - 2006.05.26

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (I) වැනි ඡේදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... | — | ආණ්ඩුවේ නිවේදන ... .. | 393 |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 392 | මිළ පාලන දැන්වීම් .. ... | — |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — | ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් .. ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — | ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන .. ... | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — | ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා .. ... | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... | — | විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් .. ... | 393 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... | — | සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් .. ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට් නිවේදන* භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු –ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැළසෙනසේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක්ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 2006 ජුනි මස 02 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යායුතු දැන්වීම් 2006 මැයි මස 19 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

**ලක්ෂමන් ගුණවර්ධන,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2006 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2006 අංක 97

D/22/NY/357.

## ශ්‍රී ලංකා නාවික හමුදාව

### නිත්‍ය නාවික උප සේවයට මාරු කිරීම

පහත නම සඳහන් නිළධාරියා 2006 අප්‍රේල් මස 03 වැනි දින සිට ශ්‍රී ලංකා නාවික හමුදාවේ ස්ථිර බලකායේ සිට නිත්‍ය නාවික උප සේවයට මාරු කිරීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත :

කොමාන්ඩර් (මාලිමා) මල්නයිදෙලාගේ රංජිත් ප්‍රනාන්දු, ආර්එස්පී, ශ්‍රීලංනාහ එන්ආර්එක්ස් 0464.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 මාර්තු මස 15 වැනි දින,
කොළඹ දී ය.

05-406

---

2006 අංක 98

D/RF/824/NY/01/03.

## ශ්‍රී ලංකා නාවික හමුදාව-ස්ථිර නාවික බලකාය

### අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද නිළයේ ස්ථිර කිරීමක්

*2005 දෙසැම්බර් මස 26 වැනි දින සිට ලුතිනන් කොමාන්ඩර් (ඉ) වශයෙන්* :

ලුතිනන් (ඉ) (තාවකාලික ලුතිනන් කොමාන්ඩර් (ඉ)) මහේෂ් ධනංජය ගොහුණුවත්තගේ, ශ්‍රීලංනාහ, එන්ආර්ඊ 0855.

අතිගරු ජනාධිපතිතුමන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 පෙබරවාරි මස 10 වැනි දින,
කොළඹ දී ය.

05-402

---

2006 අංක 99

D/RF/824/NY/01/05.

## ශ්‍රී ලංකා නාවික හමුදාව-ස්ථිර නාවික බලකාය

### අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද නිළයේ ස්ථිර කිරීමක්

*2000 ජුනි මස 14 වැනි දින සිට ලුතිනන් කොමාන්ඩර් (මාලිමා) වශයෙන්* :

ලුතිනන් (තාවකාලික ලුතිනන් කොමාන්ඩර් (මාලිමා)) රොහාන් නලීන් දේවේන්ද්‍ර, ශ්‍රීලංනාහ එන්ආර්එක්ස් 0422.

අතිගරු ජනාධිපතිතුමන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 පෙබරවාරි මස 14 වැනි දින,
කොළඹ දී ය.

05-403

---

2006 අංක 100

D/RF/824/NY/01/05.

## ශ්‍රී ලංකා නාවික හමුදාව-ස්ථිර නාවික බලකාය

### අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද උසස් කිරීම්

*2006 ජනවාරි මස 27 වැනි දින සිට තාවකාලික ලුතිනන් කොමාන්ඩර් වශයෙන්* :

ලුතිනන් දිසානායක මුදියන්සේලාගේ නලින්ද ප්‍රසාද් දිසානායක, ශ්‍රීලංනාහ, එන්ආර්එක්ස් 0879.

*2006 ජනවාරි මස 30 වැනි දින සිට තාවකාලික ලුතිනන් කොමාන්ඩර් (වි) වශයෙන්* :

ලුතිනන් (වි) මංජු සමීර ජයසේකර, ශ්‍රීලංනාහ, එන්ආර්එල් 0868.

2. ඉහත සඳහන් උසස් කිරීම් පරීක්ෂණාත්මක පදනමක් මත වන අතර, උසස් කරන ලද නිළය ඉසිලීමට නුසුදුසු බව පෙනී ගියහොත් නිළධාරීන්ගේ උසස් කිරීම් අවලංගු කොට නැවත පෙර දැරූ නිළයට පත් කරනු ලැබේ.

අතිගරු ජනාධිපතිතුමන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 මාර්තු මස 08 වැනි දින,
කොළඹ දී ය.

05-404

2006 අංක 101

D/22/NY/371.

### ශ්‍රී ලංකා නාවික හමුදාව-ස්ථිර නාවික බලකාය

### අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක් හා නිත්‍ය නාවික උපසේවයට මාරු කිරීමක්

පහත නම සඳහන් නිලධාරියා 2006 මාර්තු මස 30 වැනි දින සිට ශ්‍රී ලංකා නාවික හමුදාවේ ස්ථිර බලකායෙන් විශ්‍රාම ගැනීම සහ එදින සිට නිත්‍ය නාවික උපසේවය වෙත මාරු කිරීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත.

ලුතිනන් (වාපා) දේවතාගේ ලලිත් අශෝක කුමාර ජයසේකර, ශ්‍රීලංනාහ එන්ආර්ඩබ් 0978.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 පෙබරවාරි මස 14 වැනි දින,
කොළඹ දී ය.

05-405

# ආණ්ඩුවේ නිවේදන

## 1974 අංක 19 දරන සමාගම් (විශේෂ විධිවිධාන) නීතිය

### 3(2) වගන්තිය යටතේ නිදහස් කිරීමේ විධානය

1974 අංක 19 දරන සමාගම් (විශේෂ විධිවිධාන) නීතියේ 3(2) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර වෙළඳ, වාණිජ, පාරිභෝගික කටයුතු හා අලෙවි සංවර්ධන අමාත්‍ය ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේ වන මම මුදල් අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව නිදහස් කිරීම සඳහා ඉල්ලා ඇති මෙහි උපලේඛනයේ සඳහන් සමාගමට එම නීතියේ 2 වැනි වගන්තියේ විධිවිධාන අදාල වීමෙන් නිදහස් කරමින් විධානයක් නිකුත් කරමි.

ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේ.,
වෙළඳ, වාණිජ, පාරිභෝගික කටයුතු, අලෙවි සංවර්ධන අමාත්‍ය
සහ පාර්ලිමේන්තු ආණ්ඩු පක්ෂ ප්‍රධාන සංවිධායක.

2006ක් වූ අප්‍රේල් මස 28 වැනි දින,
කොළඹ දීය.

උපලේඛනය

අයිසීඅයිසීඅයි බැන්ක් ලිමිටඩ්

05-335

## වට්ටාපලයි කන්නකි අම්පාල් පොංකල් උත්සවය - 2006

ඉහත සඳහන් පොංකල් උත්සවය 2006 මැයි මස 29 වැනි දින පෙරවරු 6.00 පටන් 2006 ජූනි මස 12 වැනි දින පස්වරු 6.00ට අවසන් වන බව පොදු මහජනතාවගේ දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. මේ පිළිබඳව 1949 මැයි 27 වැනි දින අංක 9978 හා 1950 මැයි 26 වැනි දිනැති අංක 10105 දරන රෙගුලාසිවලට පොදු ජනතාවගේ අවධානය යොමු කරවනු ලැබේ.

03. ප්‍රසිද්ධියට පත්කරන ලද මෙම නිත්‍ය රෙගුලාසි මෙම උත්සවය පැවැත්වෙන කාල සීමාව තුල වලංගු වනවා ඇත.

ඉමෙල්ඩා සුකුමාර්,
මුලතිව් දිස්ත්‍රික්කයේ දිසාපති.

2006 මැයි මස 03 වැනි දින දී ය.

05-398

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## මහජන බැංකුව - මහනුවර ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී (29D) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2005.10.26 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ :

මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් අජන්තා කුමාරිහාමි විජේරත්න මහත්මිය විසින් සහතික කරන ලද 2000.03.08 දිනැති අංක 2481 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම-

i. පූජිත කිත්සිරි ගමගේ
ii. පාලිත පද්මසිරි ගමගේ
iii. පියල් ප්‍රේමසිරි ගමගේ
iv. ලලිත් පියසිරි ගමගේ
**v**. ප්‍රේමාවතී කොඩිකාර

යන අය විසින් පැහැර හැර ඇති බැවින්ද, එකී උකස්කරය යටතේ දැනට (i) රුපියල් විසිපන්ලක්ෂ හැත්තෑදහස් නවසිය හතලිස් හයයි ශත හැට හයක (රු. 25,70,946.66) මුදලක්ද, (ii) රුපියල් දොළොස් ලක්ෂ අනූදාහක (රු. 12,90,000) ක මුදලක්ද, (iii) රුපියල් අනූ දෙදහස් තුන්සිය පනස් හතයි ශත අසූ දෙකක (රු. 92,357.82) මුදලක් ද මහජන බැංකුවට දැනට අයවීමට ඇති බැවින් සහ (i) 2003.07.14 දින සිට වර්ෂයකට 22% බැගින් රුපියල් විසිපන්ලක්ෂ හැත්තෑදහස් නවසිය හතළිස් හයයි ශත හැට හයක (රු. 25,70,946.66) ක මුදලක් සඳහා ද (ii) 2003.07.14 දින සිට වර්ෂයකට 22%බැගින් රුපියල් දොළොස් ලක්ෂ අනූදාහ (රු. 12,90,000) ක මුදලක් සඳහා ද (iii) 2005.09.10 දින සිට වර්ෂයකට 26-5% බැගින් රුපියල් අනූ දෙදහස් තුන්සිය පනස් හතයි ශත අසූ දෙකක (රු. 92,357.82) මුදලක් සඳහා ද වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා අදාල මහජන බැංකු පනතේ 29එල් (29L) වගන්තිය යටතේ අයකර ගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී (i). රුපියල් විසිපන් ලක්ෂ හැත්තෑ දහස් නවසිය හතලිස් හයයි ශත හැටහයක (රු. 25,70,946.66) මුදල ද, (ii) රුපියල් දොලොස් ලක්ෂ අනූදහසක (රු. 12,90,000) මුදල ද, (iii) රුපියල් අනූ දෙදහස් තුන්සිය පනස් හතයි ශත අසූදෙකක (රු. 92,357.82) ක මුදල ද අයකර ගැනීම සඳහා මහනුවර බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම විසින් එකී අංක 2481 දරන

උකස්කරය යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපල හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### උකස්කර ඇති දේපළ පිළිබඳ විස්තරය

1. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, යටිනුවර ගඟවට කෝරලයේ, මහනුවර නාගරික සීමාව තුල දොඩම්වල ගමේ පිහිටි නියදගල *හේවත්* පොල්වත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ආර්. ටී. සමරසිංහ මහතා විසින් මැන සැකසූ පිඹුරේ ලොට් අංක 1 දරන පර්චස් දශම හයක් (අක්. 0, රූඩ් 0, පර්.06) විශාලත්වයට එකී පිඹුරේ ප්‍රකාර මායිම්, උතුරට : අංක 4434 දරන පිඹුරේ ලොට් අංක 03 දරන එකී ඉඩමේ ඉතිරි කොටස ද, නැගෙනහිරට : මාර්ග රක්ෂිතය ද, දකුණට : ඉහත කී අංක 691 දරන පිඹුරේ ලොට් 2 දරන කොටස ද, බස්නාහිරට : ඉහත කී අංක 691 දරන පිඹුරේ ලොට් 3 දරන කොටස ද යන මෙකී මායිම් තුල පිහිටි වැව්ලි, ගොඩනැගිලි, ගසකොළ, පලතුරු ආදී සෑම සියලු දේත් වේ.

මෙම ඉඩම මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 121/298 හි ලියාපදිංචි කර ඇත.

2. ඉහත කී දොඩන්වල පිහිටි නියදගල *හේවත්* පොල්වත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ආර්. ටී. සමරසිංහ මහතා විසින් මැන සැකසූ අංක 691 දරන පිඹුරේ ලොට් 2 දරන පර්චස් දාහතරයි දශම හතරක් (අක්කර.0, රූඩ්.0, පර්.14.4) විශාලත්වයට පිඹුරේ ප්‍රකාර මායිම්, උතුරට : ඉහත කී අංක 691 දරන පිඹුරේ ලොට් 1 දරන මාර්ග රක්ෂිතය ද, දකුණට : අංක 4434 දරන පිඹුරේ ලොට් 2ක ද, බස්නාහිරට : ලොට් 3 දරන කොටස ද, නැගෙනහිරට : බහිරවකන්ද පාර රක්ෂිතයද යන මෙකී මායිම් තුල පිහිටි වැව්ලි, ගොඩනැගිලි, ගසකොළ, පලතුරු ආදී සෑම සියලුදේත් වේ.

මෙම ඉඩම මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 308/204 හි ලියාපදිංචි කර ඇත.

ඉහත කී ඉඩම පහත සඳහන් ඉඩමට බෙදා වෙන් කළ කොටසේ වේ.

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, යටිනුවර ගඟවට කෝරළේ, මහනුවර නාගරික සීමාව තුල දොඩම්වල *නොහොත්* උඩමඩපොත පිහිටි නියදගල *හේවත්*පොල්වත්ත වරිපනම් අංක 25ඒ දරන කොටසේ බහිරවකන්දට යන පාරෙන් පළල අක්කර තුනකුත් පර්චස් තිස් දෙකක් (අක්. 3, රූඩ්.0, පර්.32) වපසරියැති ඉඩමට මායිම් උතුරට සහ නැගෙනහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටස වෙන්වන ගම්සභා පාරවල් ද, දකුණට : සමනේරිස්ගේ ඉඩමද, ඩී. ජේ. පෙරේරාට සහ තවත් අයට අයිති කුඹුරු ද, බස්නාහිරට : ලුවිස් පෙරේරාට අයිති වැලිකන්දේ ඉඩම ද යන මෙකී මායිම් තුල ඉඩමෙන් උතුරු පැත්තේ දොඩම්වලට යන පාර සහ රත්නායකට වෙන් කළ කොටසක් අතරේ නොබෙදූ අක්කරයක (අක්. 1, රූ. 0, පර්. 0) විශාල බිම් වාසියේ පිහිටි කඩගෙය සහ වෙනත් ගොඩනැගිලි අත්හැර ඉතිරි බිමෙන් සහ ඊට අයිති සියලු දෙයිනුත් නොබෙදූ දෙකෙන් පංගුවෙන් නොබෙදූ පර්චස් පහළොවක් (අක්කර 0, රූඩ් 0 පර්චස් 15) වපසරියවේ.

මෙම ඉඩමේ මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 114/300හි ලියාපදිංචි කර ඇත.

3. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර නගර සභා සීමාව තුල බ්‍රවුන්රිග් වීදියේ (දැනට යටිනුවර වීදියේ) වරිපනම් අංක 68 දරන දෙමහල් ගෙය සහිත බිමට මහනුවර දිස්ත්‍රික් උසාවියේ නඩු අංක 47911 දරන නඩුවේ අවසාන තීන්දුවට අනුව එච්. ෂොක්මන් මිනින්දෝරු තැන විසින් 1937 .04.27 දින දරන අංක X දරන පිඹුරේ ප්‍රකාර පර්චස් දෙකකුත් දශම පහයි තුනක (අක්කර 0, රූඩ් 0, පර්. 2.53) වපසරියට මායිම් උතුරට : සූරියආරච්චිගේ දොන් සයිමන් සිල්වා අප්පුහාමිගේ ඉඩම ද, නැගෙනහිරට : යටිනුවර වීදිය ද, දකුණට සහ බස්නාහිරට : අබ්දුල් පුල්ලේ සින්නතම්බිගේ ඉඩමද යන මෙකී මායිම් තුල පිහිටි ඉඩම සහ එහි තුල පිහිටි වැව්ලි, ගොඩනැගිලි, ගසකොල, පලතුරු ආදී සෑම සියලුදේත් වේ.

මෙම ඉඩම මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 300/122 හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සහකාර සාමාන්‍යාධිකාරී,
(මධ්‍යම කලාපය)

මහජන බැංකුව,
මධ්‍යම කලාප කාර්යාලය,
අංක 17, දළදා වීදිය,
මහනුවර.

05-389

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1981හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැනුණු යෝජනාව

ණය අංකය : 3/38823/එච්6/102.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2003.06.17 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

1. කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. ඩී. මලගොඩ විසින් සහතික කරන ලද 2000.09.25 දිනැති අංක 1840 දරන උකස් බැදුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, පානදුර පදිංචි හේවා ෆොන්සේකාගේ සුදත් ෆොන්සේකා යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2003.04.09 වැනි දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් තිස් හයදහස් තිස් නවයයි ශත හැත්තෑ හය (රු. 36,039.76) මුදලක් ද, පූර්වෝක්ත බැදුම්කර අංක 1840 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමකරන දිනය වනතුරු දිනකට රුපියල් දාහතරයි ශත හැත්තෑ නවය (රු. 14.79) බැගින් වැඩිපුර පොළී ද අයවිය යුතුව ඇති බැවින් ද,

2. මෙම දැන්වීමේ පළමුවන ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස් කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, පානදුර, ඩයස් ගොඩනැගිල්ලෙහි බලයලත් වෙන්දේසිකාර එච්. ගිල්ටන් පෙරේරා මහතාට බලය පැවරිය යුතු වන්නේ ය.

### උපලේඛනය

කළුතර දිස්ත්‍රික්කයේ, කළුතර උතුර තොටමුණේ, පයාගල බැද්දේ, බේරුවල ප්‍රාදේශීය සභා සීමාව තුළ (පයාගල හා මග්ගොන බැද්ද උප කාර්යාල සීමාවේ) දූවේගොඩ පිහිටි සුදුගහලන්ද නැමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු එච්. ඒ.

ඩී. ප්‍රේමරත්න විසින් මැන සකසන ලද 1999.02.25, 26, 27 සහ මාර්තු 05 දින සහ අංක 2526 දරන පිඹුරේ කැබලි අංක 4 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0. රූ. 0, පර්. 10.5ක් වූ බෙදා වෙන් කළ බිම් කොටස සහ ඊට අයිති සියලු දේත් සමඟ වේ.

තවද, එකී අංක 2526 දරන පිඹුරේ කැබලි අංක ආර් 1, ආර් 2, ආර් 3, ආර් 4, ආර් 5, ආර් 6, ආර් 7, ආර්. 8 සහ ආර් 9 මගින් ඇති මාර්ග අයිතිය ද සමඟ වේ.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන සාමාන්‍යාධිකාරී.*

2005 මැයි මස 11 වැනි දින,
ගාලු පාරේ, අංක 269,
කොළඹ 03.

05-396/6

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1981හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැනුණු යෝජනාව

ණය අංකය : 11/72782/ඩී11/026.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2006.01.31 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

1. බිබිල ප්‍රසිද්ධ නොතාරිස් නන්ද මුහන්දිරම් විසින් සහතික කරන ලද 2001.09.28 දිනැති අංක 1872 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, බිබිල පදිංචි අධිකාරී මුදියන්සේලාගේ ගුණසේකර යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2005.12.31 වැනි දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් පන්ලක්ෂ අසූහතරදහස් එකසීයයි ශත නවය (රු. 5,84,100.09) මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 1872 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමකරන දිනය වනතුරු දිනකට රුපියල් එකසිය අනූතුනයි ශත අනූහය (රු. 193.96) බැගින් වැඩිපුර පොළී ද අයවිය යුතුව ඇති බැවින් ද,

2. මෙම දැන්වීමේ පළමුවන ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස් කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, ගම්පහ, උසාවිය පාර, ස. ණ. ස. චතුරශ්‍රය, අංක 15හි බලයලත් වෙන්දේසිකාර ටී. එම්. එස්. පීරිස් මහතාට බලය පැවරිය යුතු වන්නේ ය.

### උපලේඛනය

මොණරාගල දිස්ත්‍රික්කයේ, බිබිල ප්‍රාදේශීය සභා සීමාවේ, වෙල්ලස්ස පිහිටි කැබැල්ලකැටිය පාර (වම) මොනා පාරේ, වරිපනම් අංක 07හි කැබෙල්ලකැටිය නැමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු එම්. කේ. සී. ප්‍රේමචන්ද්‍ර විසින් 1980.05.11 වැනි දින මැන සාදන ලද අංක 187 දරන මිනුම් පිඹුර ප්‍රකාර කැබලි අංක 1 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0, රූ. 1, පර්. 3ක් වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස සහ ඒ මත පිහිටි සියලු දේත් සමඟ වේ.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන සාමාන්‍යාධිකාරී.*

2005 මැයි මස 11 වැනි දින,
ගාලු පාරේ, අංක 269,
කොළඹ 03.

05-396/5

---

## මහජන බැංකුව - කැලණිය ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටත් මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2006.01.19 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ :

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් එස්. පී. එල්. විජේසිරිවර්ධන විසින් සහතික කරන ලද 1998.12.14 දිනැති අංක 3661 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්, වල්පොල කංකානමලාගේ අමිත් පෙරේරා, සේනාධීර ගංගානි යසරංසි තිලකවර්ධන සහ සේනාධීර සරස චන්දිම මිගාර තිලවර්ධන යන අය විසින් පැහැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් දසලක්ෂ විසිහත්දහසක (රු. 1,027,000) මුදලක් මහජන බැංකුවට දැනට අයවීමට ඇති බැවින් ද, 2002.03.30 වැනි දින සිට වර්ෂයකට 18% බැගින් රුපියල් දසලක්ෂ විසිහත්දහසක (රු. 1,027,000) මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය හා අදාල මහජන බැංකු පනතේ 29එල් වගන්තිය යටතේ අයකරනු ලැබිය යුතු පොළී සහ ගාස්තු ද සමඟ අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් දසලක්ෂ විසිහත්දහස් (රු. 1,27,000)ක මුදල අයකර ගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර ඊ. එස්. රාමනායක විසින් එකී අංක 3661 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ හා පරිශ්‍රයන් අතරින් ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් එස්. පී. එල්. විජේසිරිවර්ධන විසින් සහතික කරන ලද 2002.09.24 දිනැති අංක 7367 හා 2003.03.03 දිනැති අංක 7833 දරන නිදහස් කිරීමේ ඔප්පුවෙන් නිදහස් කරන ලද කොටස් අත් හැරී පසු ඉතිරි කොටස් වන මෙහි පහත විස්තර කරන දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### දේපළ පිළිබඳ විස්තරය

1. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, නවගමුව පිහිටි කෝන්ගහවත්ත *නොහොත්* මුහන්දිරම්ගෙවත්ත, නැකතිගේවත්ත *නොහොත්*බුළුගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ටී. ඩී. ජේ. පෙරේරා විසින් 2002.11.16 වැනි දින මැන සාදන ලද අංක 5404 දරන පිඹුරේ ලොට් අංක Q දරන කොටසට මායිම්, උතුරට : පාර ද, නැගෙනහිරට : ලොට් P සහ R ද, දකුණට : පිඹුරු අංක 1203හි සඳහන් ලොට් 13 ද, බස්නාහිරට : පිඹුරු අංක 1203හි සඳහන් ලොට් 4 සහ පාර ද

යන මායිම් තුළ පිහිටි පර්චස් පහලොව (අ. 0, රූ. 0, පර්. 15) ක් විශාල ඉඩම සහ එහි පිහිටි වැව්ලි, ගොඩනැගිලි ආදී සියළු දේත් වේ.

2. ඉහත කී නවගමුව පිහිටි කෝන්ගහවත්ත නොහොත් මුහන්දිරම්වත්ත, නැකතිගෙවත්ත නොහොත් බුළුගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ටී. ඩී. ජේ. පෙරේරා විසින් 2002.11.16 වැනි දින මැන සාදන ලද අංක 5404 දරන පිඹුරේ ලොට් අංක "P" දරන කොටසට මායිම් ලොට් අංක 03 දරන කොටසට මායිම්, උතුරට : පාර ද, නැගෙනහිරට : පාර ද, දකුණට : ලොට් ආර් ද, බස්නාහිරට : ලොට් ක්‍යු යන මායිම් තුළ පිහිටි පර්චස් දහය (අ. 0, රූ. 0, පර්. 10) ක් විශාල ඉඩම සහ එහි පිහිටි වැව්ලි, ගොඩනැගිලි ආදී සියළු දේත් වේ.

ඉහත විස්තර කරන ඉඩම් පහත විස්තර කරන ඉඩම්වලින් බෙදා වෙන් කරන ලද කොටස් වේ.

(අ) කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ ඉහත කී නවගමුව පිහිටි කෝන්ගහවත්ත නොහොත් මුහන්දිරම්වත්ත, නැකතිගෙවත්ත නොහොත් බුළුගහවත්ත (පිඹුරේ ප්‍රකාර ඇටඹගහවත්ත, කෝන්ගහවත්ත සහ නැතකිගෙවත්ත) නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. ඒ. විජේසිංහ විසින් 1997.10.13 වැනි දින මැන සාදන ලද අංක 1126 දරන පිඹුරේ ලොට් අංක 01 දරන කොටසට මායිම්, උතුරට : පිඹුරු අංක 1203හි සඳහන් ලොට් 5 ද, නැගෙනහිරට : පිඹුරු අංක 1203හි සඳහන් ලොට් 7 ද, දකුණට : ලොට් අංක 2 ද, බස්නාහිරට : පිඹුරු අංක 1203හි සඳහන් ලොට් 05 ද යන මායිම් තුළ පිහිටි පර්චස් විස්සයි දශම දෙකයි බින්දුව (අ. 0, රූ. 0, පර්. 20.20)ක් විශාල ඉඩම සහ එහි පිහිටි වැව්ලි, ගොඩනැගිලි ආදී සියළු දේත් වේ.

මෙම ඉඩම කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක ජී 1067/248හි ලියාපදිංචි කර ඇත.

(ආ) කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ ඉහත කී නවගමුව පිහිටි කෝන්ගහවත්ත නොහොත් මුහන්දිරම්වත්ත, නැකතිගෙවත්ත නොහොත් බුළුගහවත්ත (පිඹුරේ ප්‍රකාර ඇටඹගහවත්ත, කෝන්ගහවත්ත සහ නැකතිගෙවත්ත) නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. ඒ. විජේසිංහ විසින් 1997.10.13 වැනි දින මැන සාදන ලද අංක 1126 දරන පිඹුරේ ලොට් අංක 02 දරන කොටසට මායිම්, උතුරට : ලොට් අංක 1 ද, නැගෙනහිරට : පිඹුරු අංක 1203හි සඳහන් ලොට් 7 ද, දකුණට : පිඹුරු අංක 1203හි සඳහන් ලොට් 13 ද, බස්නාහිරට : පිඹුරු අංක 1203හි සඳහන් ලොට් 4 සහ 5 ද, යන මායිම් තුළ පිහිටි පර්චස් දහහත (අ. 0, රූ. 0, පර්. 17) විශාල ඉඩම සහ එහි පිහිටි වැව්ලි, ගොඩනැගිලි ආදී සියළු දේත් වේ.

මෙම ඉඩම කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක ජී 1067/249හි ලියාපදිංචි කර ඇත.

3. ඉහත කී නවගමුව පිහිටි කෝන්ගහවත්ත *නොහොත්* මුහන්දිරම්ගේවත්ත, නැකතිගෙවත්ත *නොහොත්* බුළුගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ටී. ඩී. ජේ. පෙරේරා විසින් 2005.01.05 වැනි දින මැන සාදන ලද අංක 5666 දරන පිඹුරේ ප්‍රකාර මායිම්, උතුරට : පාර ද, නැගෙනහිරට : පිඹුරු අංක 1203හි සඳහන් ලොට් 9 සහ ලොට් අංක 3හි කොටසක් ද, දකුණට : පිඹුරු අංක 1203හි සඳහන් ලොට් 9 සහ ලොට් 11 ද, බස්නාහිරට : පාරද යන මායිම් තුළ පිහිටි රූඩ් එකයි පර්චස් තුන (අ. 0, රූ.1, පර්. 3) ක් විශාල ඉඩම සහ එහි පිහිටි වැව්ලි, ගොඩනැගිලි ආදී සියළු දේත් වේ.

ඉහත විස්තර කරන ඉඩම පහත විස්තර කරන ඉඩමෙන් බෙදා වෙන් කළ කොටසකි.

(ඇ) ඉහත කී කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ නවගමුව පිහිටි කෝන්ගහවත්ත නොහොත් මුහන්දිරම්වත්ත, නැකතිගෙවත්ත නොහොත් බුළුගහවත්ත (පිඹුරේ ප්‍රකාර ඇටඹගහවත්ත, කෝන්ගහවත්ත සහ නැකතිගෙවත්ත) නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. ඒ. විජේසිංහ විසින් 1997.10.13 වැනි දින මැන සාදන ලද අංක 1126 දරන පිඹුරේ ලොට් අංක 3 දරන කොටසට මායිම්, උතුරට : පිඹුරු අංක 1203හි සඳහන් ලොට් අංක 7 ද, නැගෙනහිරට : කැකිරිවල පාර ද, දකුණට : ලොට් 10, 9, 11 ද, බස්නාහිරට : පිඹුරු අංක 1203හි සඳහන් ලොට් 7 ද යන මායිම් තුළ පිහිටි රූඩ් එකයි පර්චස් විසිතුනයි දශම අටයි බින්දුව (අ. 0, රූ. 1, පර්. 23.80) ක් විශාල ඉඩම සහ එහි පිහිටි වැව්ලි, ගොඩනැගිලි ආදී සියළු දේත් වේ.

මෙම ඉඩම කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක ජී. 1067/250හි ලියාපදිංචි කර ඇත.

ඉහත කී ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. ඒ. ජයරත්න විසින් 1994.10.12 සහ 1996.03.11 දින සාදන ලද අංක 1203 දරන පිඹුරේ සඳහන් ලොට් අංක 7හි මාර්ග අයිතියද සමහ වේ.

මෙම ඉඩම කොළඹ ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක ජී 1067/160හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකරු,
ගම්පහ.

මහජන බැංකුව,
බටහිර 111 කලාප කාර්යාලය,
අංක 131, නුවර පාර,
බැලුම්මහර,
මුදුන්ගොඩ.

05-387

---

## මහජන බැංකුව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 "ඩී" වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29"ඩී"වගන්තිය යටත් මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2001.01.25 දින පැවැති රැස්වීමේදී පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

මහජන බැංකුව සඳහා මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් හා නීති උපදේශක ඒ. කේ. විජේරත්න විසින් සහතිකර කරන ලද අංක 2000 හා 1999.08.24 දින දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්, අලවතුගොඩ මාතලේ පාරේ, අංක 1136හි මොහොමඩ් අවුස් අබ්දුල් කරීම් විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී අංක 1136 දරන උකස්කරය යටතේ දැනට රුපියල් විසිතුන් ලක්ෂ දහසයදහසක (රු. 2,316,000) මුදලක් මහජන බැංකුවට ලැබිය යුතු හා අයවියයුතු බැවින් ද, 2000.11.15 දින සිට වෙන්දේසි දිනය තෙක් වර්ෂයකට 24% බැගින් රුපියල් විසිතුන් ලක්ෂ දාසය දහසක (රු. 2,316,000) මුදලක් සඳහා හා තවදුරටත් පොළිය හා වෙන්දේසි ගාස්තු ද සමහ අනතුරුව කිසියම් ගෙවීම් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් විසිතුන් ලක්ෂ දාසය දහසක (රු. 2,316,000) මුදල ආපසු අයකර ගැනීම සඳහා මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන ෂොක්මන් හා සමරවික්‍රම සමාගම විසින් ඉහත කී අංක 2000 දරන උකස්කරයන් පූර්වෝක්ත බැංකුවට උකස් කොට ඇති දේපල හා භූමිය ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු

පනතේ 29"ඩී" වගන්තිය යටතේ මහජන බැංකුව විසින් පවරා ඇති බලතල ප්‍රකාර මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

දේපළ පිළිබඳ විස්තරය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, හාරිස්පත්තුවේ, උඩගම්පහ කෝරලේ, අලවතුගොඩ පිහිටි "සයිස්ටන් එස්ටේට්" යයි කියනු ලබන හා හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මිනින්දෝරු එච්. පානබොක්කේ විසින් සාදන ලද අංක 2274 හා 1975.08.03 වැනි දින දරන පිඹුරේ අංක 2 දරන බිම් කැබැල්ල වශයෙන් සලකුණු කොට ඇති බෙදා වෙන් කළ බිම් කොටසට මායිම්, උතුරට : ඇල ද, නැගෙනහිරට : අංක 3 දරන බිම් කැබැල්ල ද, දකුණට : ප්‍ර. වැ. දෙ. පාර ද, බටහිරට : අංක 01 දරන බිම් කැබැල්ල ද, යන මෙකී මායිම් තුළ රූඩ් තුනයි පර්චස් දෙකයි දශම අටක (අ. 0, රූ. 3, පර්. 2.8) විශාලත්වයෙන් යුතුව එහි පිහිටි ගොඩනැගිල්ල, වැවිලි හා සෑම සියලු දේත් සහිත වේ. මෙය මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එච් 656/03හි ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකරු,
(මහනුවර).

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 17, දළදා වීදිය,
මහනුවර.

05-390

---

## මහජන බැංකුව-මහනුවර ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29'ඩී' වගන්තිය යටත් මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2005.10.26 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ :

මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් අජන්තා කුමාරිහාමි විජේරත්න මහත්මිය විසින් සහතික කරන ලද 2004.02.19 දිනැති අංක 4105 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්, අතුල කුමාර බණ්ඩාර දොඩන්වල සහ නයනලතා මල්කාන්ති අබේසිරිවර්ධන සෙනරත් යාපා යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ දැනට

1. රුපියල් හත්ලක්ෂය (රු. 7,00,000) ක මුදලක් සහ 2. රුපියල් හයලක්ෂ දහඅට දහස් දෙසීය විසි හයයි ශත තිහ (රු. 6,18,226.30) ක මුදලක් මහජන බැංකුවට අයවීමට ඇති බැවින් ද, 1. 2004.03.01 දින සිට වර්ෂයකට 19.25% බැගින් රුපියල් හත්ලක්ෂය (රු. 7,00,000)ක මුදලක් සහ 2. 2005.06.09 දින සිට වර්ෂයකට 18.25% බැගින් රුපියල් හයලක්ෂ දහඅට දහස් දෙසීය විසි හයයි ශත තිහ (රු. 6,18,226.30) ක මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා අදාල මහජන බැංකු පනතේ "29එල්" (29L) වගන්තිය යටතේ අයකර ගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමඟ අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී 1. රුපියල් හත්ලක්ෂය (රු. 7,00,000)ක මුදල සහ 2. රුපියල් හයලක්ෂ දහඅට දහස් දෙසීය විසි හයයි ශත තිහ (රු. 6,18,226.30)ක මුදලක් අයකර ගැනීම සඳහා මහනුවර බලයලත් වෙන්දේසිකාර ශොක්මන් සහ සමරවික්‍රම විසින් එකී අංක 4105 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

දේපළ පිළිබඳ විස්තරය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, යටිනුවර ගඟවට කෝරලේ *හෙවත්* දැනට මහනුවර මහ නගර සභා සීමාව තුළ කටුකැලේ දැනට බහිරවකන්ද පාරේ පිහිටි ටවුන්විව් දැනට ශාන්ත ජෝසප්හිල් කියන ඉඩමට වර්ෂ 1962ක් වූ නොවැම්බර් මස 10 වැනි දින කේ. ජී. හේරත් මිනින්දෝරු මහතා විසින් මැන සාදන ලද අංක 1270 දරන ප්ලෑනේ ප්‍රකාර බෙදූ අංක 3ඒ දරන කට්ටිය වන පර්චස් විසි හතරයි දශම පහක් (අ. 0, රූ. 0, පර්. 24.5) ක් විශාලකම ඇති, උතුරට : අංක 02 දරන කට්ටිය ද, නැගෙනහිරට : නගර සභා ඉඩම ද, දකුණට : අංක 3බී දරන කට්ටිය ද, බස්නාහිරට : බහිරවකන්ද පාර ද යන මායිම් තුළ පිහිටි ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි, ගසකොළ, පළතුරු ආදී සෑම සියලු දේද වේ.

මෙම ඉඩම මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක ඒ 128/259හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සහකාර සාමාන්‍යාධිකාරී,
(මධ්‍යම කලාපය).

මහජන බැංකුව,
මධ්‍යම කලාප කාර්යාලය,
අංක 17, දළදා වීදිය,
මහනුවර.

05-388

---

## ජාතික ඉතිරිකිරීමේ බැංකුව

ණය අංකය : 17555/15

අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2005.09.05 දින පවත්වන ලද රැස්වීමේදී, මෙහි පහත දැක්වෙන යෝජනාව, විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් සම්මත කරගන්නා ලද බව, 1995 අංක 24 දරන පනතින් සංශෝධිත, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

'ජාතික ඉතිරිකිරීමේ බැංකුව නමට, ප්‍රසිද්ධ නොතාරිස් යැස්මින් එෆ් ඩීන් විසින් ලියා සහතික කරන ලද අංක 2067 හා 1998.01.16 දින දරන උකස් බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම, උකස්කරුවන් වන, (කලින් පානදුර, වැකඩ, කවිරාජ මාවත, 1 වන පටුමග, අංක 2/ 19 දරන ස්ථානයේ පදිංචිව සිටි) දැනට වැලිගම, කොක්මාදුව, පොල්වත්තගේ - වත්ත, ඩී. ජී. හේමපාල බාරෙ, යන ලිපිනයෙහි පදිංචි, ගහබොඩ හෙට්ටිආරච්චිගේ ක්‍රිසාන්ත සුජීව යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද, දැනට එකී උකස් බැඳුම්කරය මත 2005.09.18 වැනි දිනට රුපියල් දෙලක්ෂ අසූනව දහස් දෙසිය විසිහතක (රු. 289,227) මුදලක් ලැබිය

යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් දෙලක්ෂ අසූනවදහස් දෙසිය විසිහතක් (රු. 289,227) වූ මුදල සහ 2005.09.18 වැනි සිට දේපළ විකිණීමේ දිනය දක්වා වර්ෂයකට සියයට පහළොව (15%) බැගින් වූ පොලියද, සංශෝධිත පරිදි වූ 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තියට අනුකූලව අයකරගත හැකි මුදල් ප්‍රමාණයන් ද ප්‍රචාරක වියදම් හා දරන ලද වෙනත් ගාස්තු ද (ඉන්පසුව යම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒ මුදල අඩුකොට) අයකර ගැනීම සඳහා, ඉහත කී අංක 2067 දරන බැඳුම්කරය මගින් ජාතික ඉතිරිකිරීමේ බැංකුව වෙත උකස් කර ඇති, මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කරල දේපළ හා පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1995 අංක 24 දරන පනත මගින් සංශෝධිත පරිදි වූ 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල යටතේ, ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.'

### ඉහත සඳහන් උපලේඛනය

බස්නාහිර පළාතේ, කලුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුණේ, පානදුර තල්පිටි දෙබැද්දේ, පානදුර ප්‍රාදේශීය සභා තන්තිරිමුල්ල උප කාර්යාල බල ප්‍රදේශය ඇතුළත, ගල්තුඩේ සහ හිරණ යන ගම්වල පිහිටි රත්නගිරිය එස්ටේට් නමැති ඉඩමේ, බලයලත් මිනින්දෝරු බී. එල්. ඩී. ප්‍රනාන්දු විසින් මැන සාදන ලද අංක 3518හා 1991 අගෝස්තු 08 වෙනි දින දරන පිඹුරේ දැක්වෙන ලොට් එච් ලෙස ලකුණු කළ බෙදා වෙන් කළ බිම් කට්ටියට මායිම්, උතුරට : ලොට් ජී දරන කට්ටියද නැගෙනහිරට : අංක 3448 දරන පිඹුරේ දැක්වෙන ලොට් අංක 4 ද දකුණට : අංක 448 දරන පිඹුරේ දැක්වෙන (පාරක් සඳහා වෙන් කළ) ලොට් බී දරන කට්ටියද බස්නාහිරට : ලොට් අංක 1 යන මායිම් ඇතුළත, ඉහත කී අංක 3518 දරන පිඹුර ප්‍රකාර පර්චස් දහහතරක් (0අ. 0 රූ. 14ප.) විශාලත්වය ඇති බිම් කට්ටිය සහ එහි පිහිටි ගොඩනැගිලි, ගසකොළ, වැවිලි සහ වෙනත් සියලු දේ. මෙම ඉඩම පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එෆ් 125/287 යටතේ ලියාපදිංචි වී ඇත.

මෙයට, ඉහත කී අංක 3518 පිඹුරේ ලොට් අංක 1 සහ බලයලත් මිනින්දෝරු සී. ඩබ්ලිව්. ද නීස් විසින් මැන සාදන ලද අංක 448 හා 1961 දෙසැම්බර් 27 සිට 29 දක්වා දින දරන පිඹුරේ ලොට් 'ඒ' 'බී' යන, පාරවල් සඳහා වෙන් කළ බිම් කට්ටි මතින් සහ ඔස්සේ මාර්ග අයිතියද ඇතුළත් වේ.

කළමනාකරු - (ණය)

255, ගාලු පාර,
කොළඹ 3.

05-368